# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2012/18 – 2017 මාර්තු 29 වැනි බදාදා – 2017.03.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (ආ) අතුරු විධානය යටතේ ආඥාව

**2017 අංක 82 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2015/ඩබ්එස්/98.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
බීයූ/එල්එන්ඩී/01/ඒකිව්යූර්ආර්/07.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (ආ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම්, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ අනුරූප සටහනේ විස්තර ඇති පරවශ්‍යතාවයට යටත් වන බව මෙම ආඥාවෙන් ප්‍රකාශයට පත් කරමි.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

2017 මාර්තු මස 21 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩමේ විස්තරය.**– ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බුත්තල වැදිරට කෝරළේ සුළු කොට්ඨාසයේ, ඔක්කම්පිටිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ඕ/බීටීටී/2015/725 හා 2016.06.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ, බී හා සී ලෙස දක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1220ක් පමණ වන ඉඩම් කොටස් 03ට මායිම්:

2. **පරවශ්‍යතාවේ විස්තරය.**– මොණරාගල - බුත්තල ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ කුඹුක්කන තුළුමුව ඉඩමට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටස්වල පරවශ්‍යතා අයිතිය අත්කර ගැනීම.

01. **කැබලි අක්ෂර "ඒ" – ඇලමානය – ප්‍රමාණය: හෙක්. 0.0619ක් පමණ**

උතුරට: ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය; නැගෙනහිරට: ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය සහ ඇළ; දකුණට: ඇළ, ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය සහ කුඹුක්කන්ඔය; බටහිරට: ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය සහ කුඹුක්කන්ඔය.

02. **කැබලි අක්ෂර "බී" – ඇලමානය – ප්‍රමාණය: හෙක්. 0.0495ක් පමණ**

උතුරට: ඇළ, ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය; නැගෙනහිරට: ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය සහ මාර්ගය; දකුණට: මාර්ගය

1A – G 25341 – 52 (2017/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සහ ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය; බටහිරට: ඊ. ඒ. අනුලාවතී හිමිකම් කියන ඇලමානය සහ ඇළ.

03. **කැබලි අක්ෂර "සී" – ඇලමානය – ප්‍රමාණය: හෙක්. 0.0106ක් පමණ**
උතුරට: ඇළ සහ අයිතිකරු සොයාගත නොහැකි ඇලමානය; නැගෙනහිරට: අයිතිකරු සොයාගත නොහැකි ඇලමානය සහ මාර්ගය (මා.සං.අ.); දකුණට: මාර්ග (මා.සං.අ.) සහ අයිතිකරු සොයාගත නොහැකි ඇලමානය; බටහිරට: අයිතිකරු සොයාගත නොහැකි ඇලමානය සහ ඇළ.

04 - 296

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2017 අංක 83 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/05/2001/එෆ්ආර්/134.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: උදු/2/5/2/68.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38(අ) වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව වැඩබලන ඉඩම් අමාත්‍ය, විජේසුන්දර මුදියන්සේලාගේ තිලකරත්න බණ්ඩාර ඒකනායක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ටී. බී. ඒකනායක,
(වැ.බ.) ඉඩම් අමාත්‍ය.

2017 මාර්තු මස 22 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
අංක 1200/6, "මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, උඩුදුම්බර.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්දෙක කෝරළේ සුළු කොට්ඨාසයේ, කරඹකැටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි.මහ. 5988 හා 2009.02.17 දිනැති පිඹුරේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 01 – වින්ච්ෆීල්ඩ් පාර්ක් වත්ත – ප්‍රමාණය: හෙක්. 1.7438**
උතුරට: මාර්ගය සහ කඳුර; නැගෙනහිරට: කඳුර සහ රජය හිමිකම් කියන වින්ච්ෆීල්ඩ්පාක් වත්ත; දකුණට: රජය හිමිකම් කියන වින්ච්ෆීල්ඩ්පාක් වත්ත සහ කේ. නඩරාජා හිමිකම් කියන වින්ච්ෆීල්ඩ්පාක් වත්ත; බටහිරට: කේ. නඩරාජා හිමිකම් කියන වින්ච්ෆීල්ඩ්පාක් වත්ත සහ මාර්ගය.

04 - 297

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.